01. **වසමේ නම සහ අංකය :-** 850 A මිරිස්වත්ත

02. හැඳින්වීම:-

වල්ලලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ දකුණු භාගයේ දකුණු පළාත් සීමාවේ පිහිටා ඇත. මෙම කොට්ඨාශය උතුරින් අගලවත්ත හා මතුගම ප්‍රාදේශය ලේකම් කොට්ඨාශ වලින්ද දකුණු දෙසින් බෙන්තර ගඟින් ද මායිම් වන දකුණු පළාත් සීමාවෙන්ද (ගාල්ල දිස්ත්‍රික්කය) නැගෙනහිර නියාගම සහ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින්ද මායිම් වන වර්ග කිලෝමීටර් 210.6 කින් යුත් භූමි භාගයකි.

කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතුරින් පොදු පහසුකම් ඒඅණ ග්‍රාම නිලධාරී වසම් 60 න් එක් වසමක් වන 850 A මිරිස්වත්ත ග්‍රාම නිලධාරී වසමට අයත් වන ප්‍රදේශ වන්නේ පුස්සවල මිරිස්වත්ත,ගොරකදූව යන ගම්මාන තුනෙහි එකතුවයි. මෙහි පවුල් 281 ක් ජීවත් වන අතර මුළු ජනගහනය 986 ක් පමණ වේ.

මෙම ග්‍රාම නිලධාරී වසමට අයත් සමස්ථ භූමි ප්‍රමාණය අක්කර 835 ක් වන අතර වී අක්කර 93 ක් ද, තේ අක්කර 130 ක් ද ,රබර් අක්කර 22 ක් ද ,පොල් අක්කර, 54 ක් ද කුරුඳු අක්කර 120 ක් ද, මිශ්‍ර බෝග අක්කර 34 ක් ද, ගෙවතු අක්කර 180 කින්ද සමන්විත වේ. කඳුකර කඳුකර භූමියකින් යුක්ත වන මෙම වසමෙහි ජීවත් වන ජනතාව මිශ්‍ර භෝග වගාව තුලින්ද මීට අමතරව ප්‍රධාන ජීවනෝපාය ලෙස වී ගොවිතැනෙහි නියලෙති.

නම හැදුන ආකාරය :-

මිරිස්වත්ත ග්‍රාම නිලධාරී වසමට ,පුස්සවල,ගොරකදූව කොටසක් සහ මිරිස්වත්ත යන ගම්මාන තුනෙහි එකතුවෙන් මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාශය නිර්මාණය වී ඇත.මිරිස්වත්ත යනුවෙන් නම සෑදි ඇති ආකාරය ජනප්‍රවාදයේ සඳහන් වන්නේ මේ ආකාරයටය.

මිරිස්වත්ත යුධ හමුදා කඳවුර අවට ප්‍රදේශයේ විශාල වශයෙන් මිරිස් වගාව පවලිත වී තිබී ඇති අතර එම නිසා එදා පටන් අද දක්වා මිනිසුන් අතර ව්‍යාවහාර වී ඇත්තේ මිරිස්වත්ත යනුවෙනි.

ගමන් මාර්ගය :-

මතුගම පැලවත්ත ගමන් මාර්ගයේ පැලවත්ත හංදියෙන් 4 Km පමණ පිටිගල දෙසට ගමන් කිරීමේදී මිරිස්වත්ත ගම්මානය හමුවේ මිරිස්වත්ත පාසල අසලින් ආරම්භ වන ග්‍රාම නිලධාරී වසම දකුණ පළාත් සිමාවෙන් අවසන් වේ.මිරිස්වත්ත ,ගොරකදූව කොටසත් සහ පුස්සවල යන ගම්මාන තුනෙහි අතුරු මාර්ග වලින් මෙම වසමට ප්‍රවේශ විය හැකිය.

- **භූමියේ ස්වාභාවය** :- කඳු සහිත වීම.
- **පස් වර්ගය** :- මැටි පස